ශ්‍රී ලංකා ජනාධිපති

இலங்கை சனாதிபதி

President of Sri Lanka

# හජ් පණිවිඩය

අතිශය දුෂ්කර  කාල පරිච්ඡේදයකින් පසු නැවුම් අපේක්ෂා සහිත අනාගතයක් උදෙසා ප්‍රයත්නයක යෙදෙන මොහොතක 2023 වර්ෂයේ එළැඹි හජ් උත්සවය අන් කවරදාටත් වඩා අපට සුවිශේෂ වේ.

දුකෙහි ගැලී සිටින ජනයා එම දුෂ්කරතාවයෙන් මුදා ගැනීමට අපේක්ෂාවකින් තොරව ඉදිරිපත්වීමේ සහ ඊට විසඳුම් සෙවීමේ මානුෂීය මෙහෙවරක නිරතවීමේ අගය, තෘප්තිය  හජ් උත්සවයෙන් පිළිඹිඹු කෙරේ.

කැපවීමේ සහ පරිත්‍යාගයේ ඓතිහාසික සර්වකාලීන සංකේතය ලෙස ඉබ්‍රාහිම් නබිතුමාත්, එතුමාගේ පුත් ඉස්මායිල් නබිතුමාත්,  හාජර්  මව්තුමියත් සැලකේ. ඔවුහු ශතවර්ෂ ගණනාවක් සමස්ත ලෝකවාසී  ජනතාවගේ ගෞරවයට ලක්වනුයේ ඔවුන් සිදුකළ කැපකිරීම්වලට කෘතවේදීත්වය එල කිරීමක් ලෙසිනි.

මෑත අතීතය තුළ ශ්‍රී ලංකාව පැවතියේ ද එබඳු දුෂ්කර තත්ත්වයක හෙවත් පසුබිමකය. එම දුෂ්කරතා මඟහැර රට වර්තමාන තත්ත්වයට පමුණුවා ගැනීම සඳහා ජනතාව කළ පරිත්‍යාගය, කැපවීම සහ ඉවසීම අතිශය සාධනීය හේතුවක් විය. ඔබ කළ කැප කිරීමටත්  ඒ අතිශය තීරණාත්මක අවදිය සිහිපත් කිරීමටත්, හජ් උත්සවය වඩාත් උචිත අවස්ථාවක් ලෙස මම දකිමි.

එළැඹෙන හජ් සමය වන විට පවතින ආර්ථික, සමාජීය දුෂ්කරතාවන්ගෙන් සම්පූර්ණයෙන් මිදීමට සියලු දෙනාගේ දායකත්වය, මැදිහත්වීම සහ සහභාගීත්වය අතිශය වැදගත් වේ. කලාපීය සහ ගෝලීය ඉලක්ක ළඟා කර ගැනීමට සියලු දෙනා එක්ව සාමූහික අරමුණකට අත්වැල් බැඳගන්නැයි හජ් උත්සව සමයේදී ද මම ඔබට ආරාධනා කරමි.

වැඩිහිටි අපි අත්විඳින දුෂ්කරතා අනාගත පරපුරට නොතබා, ඔවුන් තිරසර සතුටක් සහිත ගෝලීය සමාජයේ ගෞරවයට ලක්වන අභිමානවත් ජාතියක් ලෙස ඔසවා තැබීමට කටයුතු කිරීමේ වැදගත්කම වත්මන් වැඩිහිටි සහ තරුණ ඔබට මේ අසිරිමත් හජ් උත්සවයේ දී සිහිපත් කරමි.

එළැඹි හජ් උත්සවය ශ්‍රී ලාංකේය ඉස්ලාමීය සහෝදර ජනයා සහ ගෝලීය ඉස්ලාමීය බැතිමතුන් ඇතුළු සැමට සුබ ප්‍රීතිමත් උත්සවයක් වේවා! යි ප්‍රාර්ථනා කරමි.

රනිල් වික්‍රමසිංහ
ජනාධිපති
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

2023 ජූනි 28 වන දින